# ව්‍යාපාර අධ්‍යයනය

## 9.2 විවිධ සන්නිවේදන ක්‍රම විමසමින් ඵලදායිව සන්නිවේදනයේ යෙදෙයි



Start Your Learning Journey with e-thaksalawa

The National e-learning Portal for The General Education

**නිපුණතා මට්ටම : 9.2**

**විවිධ සන්නිවේදන ක්‍රම විමසමින් ඵලදායිව සන්නිවේදනයේ යෙදෙයි**

## ඉගෙනුම් ඵල

- සන්නිවේදන මාධ්‍ය හඳුන්වයි
- එක් එක් සන්නිවේදන මාධ්‍ය සඳහා සන්නිවේදන ක්‍රම ඉදිරිපත් කරයි
- නවීන විද්‍යුත් සන්නිවේදන ක්‍රම පැහැදිලි කරයි
- විද්‍යුත් නොවන සන්නිවේදන ක්‍රම පැහැදිලි කරයි
- ව්‍යාපාර ආයතන යොදා ගන්නා අභ්‍යන්තර හා බාහිර සන්නිවේදන ක්‍රම ලැයිස්තු ගත කරයි
- ඵලදායි සන්නිවේදනයට ඇති බාධා පෙන්වා දෙයි
- සන්නිවේදනයට ඇති බාධා පිටු දැකීමට ක්‍රමෝපාය යෝජනා කරයි
- විවිධ සන්නිවේදන මාධ්‍යවල වාසි හා අවාසි සාකච්ඡා කරයි



Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය :- සී. සී. මලවිපතිරණ මිය, ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, හෝමාගම.
සැකසුම :- කසුන් දොරණෑගොඩ මයා, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය.
අන්තර්ගතය පරීක්ෂා කිරීම:- ජනක් විජේගුණවර්ධන , රාජකීය විද්‍යාලය , හොරණ

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## වර්තමානයේ භාවිත වන සන්නිවේදන මාධ්‍ය

වාචික



ලිඛිත



සංඥා හා සංකේත







Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය :- සී. සී. මලවිපතිරණ මිය, ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, හෝමාගම.
සැකසුම :- කසුන් දොරණෑගොඩ මයා, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය.
අන්තර්ගතය පරීක්ෂා කිරීම:- ජනක් විජේගුණවර්ධන , රාජකීය විද්‍යාලය , හොරණ

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## අභ්‍යන්තර සන්නිවේදනය

ව්‍යාපාර **ආයතනයක් ඇතුළත** විවිධ පාර්ශ්ව අතර තොරතුරු හුවමාරු කර ගැනීම

## බාහිර සන්නිවේදනය

ව්‍යාපාර ආයතනයක් **බාහිර පාර්ශ්ව හා ආයතන** අතර තොරතුරු හුවමාරු කර ගැනීම

## සන්නිවේදනය සිදුවන පාර්ශ්ව

### අභ්‍යන්තර

- අයිතිකරුවන් — කළමනාකරුවන් අතර
- සේවකයන් — සේවකයන් අතර
- දෙපාර්තමේන්තු — දෙපාර්තමේන්තු අතර

### බාහිර

- ව්‍යාපාරය — ගනුදෙනුකරුවන් සමග
- ව්‍යාපාරය — වෙනත් ව්‍යාපාර සමග
- ව්‍යාපාරය — සැපයුම්කරුවන් සමග
- ව්‍යාපාරය — රජය සමග
- ව්‍යාපාරය — විදේශීය ව්‍යාපාර සමග



අන්තර්ගතය :- සී. සී. මලවිපතිරණ මිය, ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, හෝමාගම.
සැකසුම :- කසුන් දොරණෑගොඩ මයා, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය.
අන්තර්ගතය පරීක්ෂා කිරීම:- ජනක් විජේගුණවර්ධන , රාජකීය විද්‍යාලය , හොරණ

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## විධිමත් සන්නිවේදනය

ආයතනයක පවතින නීතිරීතිවලට අනුකූලව පිළිගත් ආකාරයට වගකීමක් සහිතව නිල වශයෙන් සිදු වන සන්නිවේදනය විධිමත් සන්නිවේදනය ලෙස හැඳින්වේ. එනම් ආයතනයේ නිල සංවිධාන ධූරාවලිය භාවිත කරමින් කරනු ලබන සන්නිවේනයයි.

උදා : සාකච්ඡා ,රැස්වීම් ,ලිපි ,චක්‍රලේඛ ,මෙමෝ පත්‍ර , ඊ- මේල්










## අවිධිමත් සන්නිවේදනය

ආයතනයක සිදු වන නිල නොවන තොරතුරු හුවමාරු ක්‍රම අවිධිමත් සන්නිවේදනය ලෙස හැඳින්වේ. ආයතනයක සිටින අවිධිමත් කණ්ඩායම් අතර මෙසේ අවිධිමත් ලෙස සන්නිවේදනය සිදු වේ. මෙය බොහෝ විට සිදුවන්නේ ආයතනයේ නිල සංවිධාන ධූරාවලියට බාහිරින්ය.

උදා : කට කතා , නිර්නාමික ලිපි ,නිර්නාමික දුරකථන ඇමතුම් ,පෙත්සම්, අවිධිමත් සාකච්ඡා හා රැස්වීම්










Copyright © www.e-thaksalawa.moe.gov.lk

## විවිධ සන්නිවේදන මාධ්‍යය මගින් සන්නිවේදනය සිදු කරන ක්‍රම

| මාධ්‍යය අනුව | භාවිත ක්ෂේත්‍රය අනුව | තාක්ෂණය අනුව | සන්නිවේදන ක්‍රමය අනුව |
|---|---|---|---|
| වාචික | අභ්‍යන්තර | විද්‍යුත් නොවන | අභ්‍යන්තර රැස්වීම්, සම්මුඛ සාකච්ඡා, සම්මන්ත්‍රණ |
| | | විද්‍යුත් | ඉන්ටර්කොම් |
| | බාහිර | විද්‍යුත් නොවන | රැස්වීම් , අඬබෙර ගැසීම , සංවාද , සම්මන්ත්‍රණ |
| | | විද්‍යුත් | දුරකථන , ජංගම දුරකථන , ශබ්ද විකාශන යන්ත්‍ර , හඬ තැපැල , ගුවන් විදුලිය , රූපවාහිනිය |
| ලිඛිත | අභ්‍යන්තර | විද්‍යුත් නොවන | මෙමෝ පත්‍ර , දැන්වීම් පුවරු , වාර්තා, නිවේදන |
| | | විද්‍යුත් | විද්‍යුත් දැන්වීම් පුවරු , ඊ -මේල් , Intranet, SMS සේවා |
| | බාහිර | විද්‍යුත් නොවන | ලිපිය , තැපැල් පත , පුවත් පත්, සඟරා , බැනර් , පෝස්ටර් , ගැසට් පත්‍ර , අත් පත්‍රිකා ,වාර්තා |
| | | විද්‍යුත් | Fax , E-mail , විද්‍යුත් දැන්වීම් පුවරු ,SMS සේවා |
| සංඥා හා සංකේත | අභ්‍යන්තර | විද්‍යුත් නොවන | සීනුව ,මග සලකුණු , ආයතනයේ පිහිටීම දැක්වෙන සැලැස්ම , පා සලකුණු , ස්ථාන හඟවන සලකුණු |
| | | විද්‍යුත් | විදුලි සීනුව , අභ්‍යන්තර අනතුරු ඇඟවීම් සංඥා |
| | බාහිර | විද්‍යුත් නොවන | ඇසුරුම් සංකේත , දුම්රිය හා මහාමාර්ග සංඥා , බිහිරි පුද්ගලයන් සඳහා භාවිත සංඥා , වෙළෙඳ කටයුතුවල දී භාවිත වන සලකුණු, ක්‍රීඩා විනිසුරුවන්ගේ තීරණ ලබා දීම |
| | | විද්‍යුත් | දුම්රිය හා මහා මාර්ග විදුලි සංඥා , අනතුරු හඟවන නළා , ගිලන් රථ සංඥා |

අන්තර්ගතය :- සී. සී. මලවිපතිරණ මිය, ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, හෝමාගම.
සැකසුම :- කසුන් දොරණෑගොඩ මයා, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය.
අන්තර්ගතය පරීක්ෂා කිරීම:- ජනක් විජේගුණවර්ධන , රාජකීය විද්‍යාලය , හොරණ

Copyright © www.e-thaksalawa.moe.gov.lk

# විද්‍යුත් නොවන සන්නිවේදන ක්‍රම

## සාකච්ඡා (Discussion)

ආයතනවල අභ්‍යන්තරිකව බහුලව යොදා ගැනෙන සන්නිවේදන ක්‍රමයකි. විවිධ මට්ටම්වල දී විවිධාකාර සාකච්ඡා සිදු වේ.






## රැස්වීම් (Meeting)

මාණ්ඩලික රැස්වීම් , කමිටු රැස්වීම් , වාර්ෂික රැස්වීම් ආදී වශයෙන් ආයතනවල විධිමත්ව සන්නිවේදනය සිදු වන ක්‍රමයකි .

## ලිපි (Letters)

ව්‍යාපාරික ලිපි ප්‍රබල සන්නිවේදන ක්‍රමයකි .සරලව ,සංක්ෂිප්තව ,නිවැරදිව හා ක්‍රමවත්ව ලිපි සැකසිය යුතුයි. සේව්‍ය - සේවක පාර්ශ්ව අතර අභ්‍යන්තරිකව මෙන් ම බාහිර පාර්ශ්ව අතර ද යොදා ගන්නා සන්නිවේදන ක්‍රමයකි .


DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA
MINISTRY OF HIGHER EDUCATION HIGHWAYS
ROAD DEVELOPMENT AUTHORITY
MISCELLANEOUS FOREIGN AIDED PROJECTS

Invitation for Bids

Date: 25/02/2016
Loan Title: 1511PB of National Roads
Contract No. and Title: RDA/MFAP/ICB/OFID-2/05 Section from Godagama to

Deadline for Submission of Bids: [26/04/2016] (Be

1. The Democratic Socialist Republic of Sri L International Development (OFID) towards th District carried out by the Miscellaneous Fo used for payments under the contract named
2. The Road Development Authority ("the Empl the improvement of B240 Kotte – Bope Roac which is in Colombo District . The constructio

   The International Competitive Bidding will b Bidding Procedure with post qualification.
3. Eligible bidders must meet the following gene
   (i) Pending Litigation shall not represent
   (ii) The bidders net worth within last 5 yea
   (iii) General experience in construction cor
   (iv) Average annual construction turnover construction experience within last 7 y

| Contract Package (CP) No | US |
|---|---|
| RDA/MFAP/ICB/OFID-2/05 | |

   (v) Personnel: the bidder must demonstra each project: (i) 1 Project Manager minimum 5 years experience in simila Equivalent with 8 years total & minim (NDTor Equivalent with 8 years total (posses valid licence issued from D experience in similar works.
   (vi) Equipment: The Bidder must demon presentation of proof of ownership o equipment will remain on site as per th

| No. | Equipment Type an |
|---|---|
| 1 | Asphalt Plant (80 – 100)tonne |
| 2 | Asphalt Sensor Paver (3.5 – 5 |
| 3 | Concrete truck mixer |

4. The rehabilitation and upgrading activi
   - Surfacing of AC overlay;
   - Drainage construction / improvemen

நீதியரசர் க. வி. விக்னேஸ்வரன்
முதலமைச்சர் - வட மாகாணம்
විනිසුරු සී. වී. විග්නේශ්වරන්
ප්‍රධාන අමාත්‍ය - උතුරු පළාත
Justice C.V.Wigneswaran
Chief Minister - Northern Province

Telephone 021 320 2465, 021 221 7313, 021 221 7311
Fax 021 221 7227
26, Somasundaram Avenue, Chundikkuli, Jaffna.
email cmofficenorthernpc@gmail.com

Minister of Finance & Planning, Law & Order, Lands, Road Development & Electricity, Housing & Construction, Water supply, Co-operative Development, Social Service & Rehabilitation, Women's Affairs, Industries and Enterprise promotion, Tourism, Local Government and Provincial Administration, Food supply and Distribution.

My No NPC/CM/01/3837/2014 Date 10.10.2014

His Excellency Mahinda Rajapakse
President of the Democratic Socialist Republic of Sri Lanka
Presidential Secretariat,
Colombo 1.

Your Excellency,

**Special District Development Meeting – 2014**
**Jaffna/Mannar/Vavuniya/Mullaitivu/Kilinochchi**

1. I refer to letter dated 23rd September 2014 under reference PCMD/1/6/DCC/2014 sent by Your Excellency's Chief of Staff Mr.Gamini S. Senarath, the entirety of which is reproduced below:

   *"Under the series of scheduled Special District Development meetings to be chaired by His Excellency the President, the Special Joint District Development meeting meant for districts of Jaffna/Mannar/ Vavuniya/ Mullaitivu/ Kilinochchi will be held on 13th October 2014 at 10.30 am. at Weerasingham Hall, Jaffna.*

   *The **progress of implementation of decisions reached at the progress review meetings at the district level in 2012** and the evaluation of progress in relation to the future development works to be launched in terms of the Medium Term Investment Plan 2014 – 2016 are expected to be discussed at this scheduled meeting.*

   *Your presence at this meeting is kindly requested." **(emphasis added)***


2. The Northern Provincial Council (NPC) was neither consulted nor informed of the necessity or agenda of this curious meeting that purports to deal with issues addressed in 2012 after a lapse of two years. As Your Excellency is aware we have been conducting District Coordination Committee Meetings co-chaired by the Chief Minister, NPC and certain Central Government Ministers. The NPC, which was constituted after the Provincial Council elections in 2013, where the People of the Northern Province

Copyright www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය :- සී. සී. මලවිපතිරණ මිය, ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, හෝමාගම.
සැකසුම :- කසුන් දොරණෑගොඩ මයා, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය.
අන්තර්ගතය පරීක්ෂා කිරීම:- ජනක් විජේගුණවර්ධන , රාජකීය විද්‍යාලය , හොරණ

## මෙමෝ පත්‍ර (Memos)

ආයතනයක නිලධාරීන් විසින් තවත් පාර්ශ්වයකට කෙටි පණිවුඩයක් ලබා දීමට මෙමෝ පත්‍ර යොදා ගැනේ. මෙහි දිනය , පණිවුඩය යවන්නාගේ නම හා තනතුර ,ලබන්නාගේ නම හා තනතුර , පණිවිඩය ඉතා කෙටියෙන් සඳහන් වේ.



Computown Public School System

Memo


Research Proposal Memo

To: Dr. Karen C. Holt
From: Rachel Lefoll, Emma Mason
Date: 28 January 2010
Subject: From Print to the Press: the Creative Writing Process to the Editing and Publishing Process

Purpose

Background

Significance



UNIVERSITY OF ARKANSAS Sam M. Walton College of Business Business Communication Center

EMPLOYMENT CONDITIONS COMMISSION

REPORT TO THE MINISTER OF LABOUR ON SMALL BUSINESS

1. INTRODUCTION

## වාර්තා (Reports)

ව්‍යාපාර ආයතනවල මාසික , ත්‍රෛමාසික, සිව්මස් හා වාර්ෂික වාර්තා ලෙස විවිධ වාර්තා මගින් තොරතුරු ලබා දෙයි.

## බැනර් / පෝස්ටර්




අන්තර්ගතය :- සී. සී. මලවිපතිරණ මිය, ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, හෝමාගම.
සැකසුම :- කසුන් දොරණෑගොඩ මයා, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය.
අන්තර්ගතය පරීක්ෂා කිරීම:- ජනක් විජේගුණවර්ධන , රාජකීය විද්‍යාලය , හොරණ

Copyright © www.e-thaksalawa.moe.gov.lk

# විද්‍යුත් සන්නිවේදනය

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ දියුණුවත් සමග බිහිවුණු සන්නිවේදන ක්‍රමයක් වන මෙය විදුලි සංදේශ ජාලයන් සහ අංකිත (Digital) තාක්ෂණය මගින් තොරතුරු හුවමාරු වේ.

## 1. අන්තර්ජාලය (Internet)

පුළුල් පරාසයක් ආවරණය කරමින් අන්තර්ජාතික වශයෙන් ඇති පරිගණක ජාලය , අන්තර්ජාලය ලෙස හැඳින්වේ.





## 2. විද්‍යුත් තැපැල ( E– Mail)

අන්තර්ජාලය උපයෝගී කරගෙන පරිගණකයකින් පරිගණකයකට පණිවුඩ හුවමාරු කිරීම විද්‍යුත් තැපැල ලෙස හැඳින්වේ. යවන්නා හා ලබන්නා යන දෙපාර්ශවයට ම අන්තර්ජාල පහසුකම මෙන් ම E-mail ලිපින ද තිබිය යුතු ය.



## 3. අභ්‍යන්තර ජාල (Intranet)

අන්තර්ජාලය ඔස්සේ ව්‍යාපාර ආයතනයක දත්තවලට ළඟා වීමට ඉඩ සලසා ඇති ආයතනමය ජාලයකි. මෙය ආයතනයේ පාලනය යටතේ පවතින අතර අවසරලත් අයට පමණක් මෙම ජාලයට සම්බන්ධවිය හැකිය.



අන්තර්ගතය :- සී. සී. මලවිපතිරණ මිය, ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, හෝමාගම.
සැකසුම :- කසුන් දොරණෑගොඩ මයා, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය.
අන්තර්ගතය පරීක්ෂා කිරීම:- ජනක් විජේගුණවර්ධන , රාජකීය විද්‍යාලය , හොරණ

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## 4. හඬ තැපැල (Voice mail)

යවන්නා විසින් දූරකථන මාර්ගයෙන් වාචිකව දෙනු ලබන පණිවුඩය, ජාල මාර්ගයෙන් පරාවර්තනය වී පසුව ලබා ගැනීමට පිණිස තැටියක පටිගත කිරීමේ ක්‍රියා පද්ධතියකි.




## 5. ෆැක්ස් (Fax)

සිතියම් ,රූප සටහන් ,චිත්‍ර ආදී සටහන් අඩංගු ලියවිලි ක්ෂණිකව යැවීමට හැකියාව ඇති විද්‍යුත් උපකරණයකි. යවන ලද ලිපිවල ඡයා පිටපත් ලබන්නාගේ ෆැක්ස් යන්ත්‍රයෙන් ලබා ගත හැකි වේ . විදේශීය මෙන් ම දේශීය වශයෙන් ද භාවිත වේ .



## 6. ජංගම දූරකථන (Mobile Phones)

ඉතා ප්‍රචලිත ,සුලභව භාවිත වේ. විවිධ ව්‍යාපාර කටයුතු ජංගම දූරකථන මගින් සිදු වේ.




## 7. ඉන්ටර්කොම් (Intercom)

ආයතනයක අභ්‍යන්තර සන්නිවේදනය සඳහා ස්ථාපිත දූරකථන පද්ධතියකි . ඒ ඒ අංශ සඳහා වෙන් වෙන් වශයෙන් ඉන්ටර්කොම් අංක ලබා දේ. අදාළ අංකය සටහන් කිරීමෙන් අවශ්‍ය පුද්ගලයා ඇමතිය හැකියි.






අන්තර්ගතය :- සී. සී. මලවිපතිරණ මිය, ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, හෝමාගම.
සැකසුම :- කසුන් දොරණෑගොඩ මයා, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය.
අන්තර්ගතය පරීක්ෂා කිරීම:- ජනක් විජේගුණවර්ධන , රාජකීය විද්‍යාලය , හොරණ

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## සඵලදායි සන්නිවේදනයට ඇති බාධා

- නව තාක්ෂණ ක්‍රම පිළිබඳ ඇති දැනුම් මඳ කම
- සන්නිවේදන උපකරණ භාවිතයේ දී සිදු වන බාහිර බාධා
- පැරණි සන්නිවේදන ක්‍රම භාවිතයට ගැනීම
- සන්නිවේදන ගලා යාමේ මාර්ගයේ දී ඇති වන බාධා
- සන්නිවේදන සැලසුම්වල ඇති දුර්වලතා
- භාෂා ගැටලු, දැනුම, ආකල්ප වැනි දෑ
- බාහිර පරිසරයේ ඇති වන බාධා



Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය :- සී. සී. මලවිපතිරණ මිය, ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, හෝමාගම.
සැකසුම :- කසුන් දොරණෑගොඩ මයා, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය.
අන්තර්ගතය පරීක්ෂා කිරීම:- ජනක් විජේගුණවර්ධන , රාජකීය විද්‍යාලය , හොරණ

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## සන්නිවේදනයට ඇති වන බාධා පිටු දැකීමට ගත හැකි ක්‍රියාමාර්ග

- නව සන්නිවේදන උපකරණ භාවිත කිරීම
- සන්නිවේදනය පිළිබඳ විවිධ නීති රීති පැනවීම
- සන්නිවේදන කුලුනු හා ජාල ආවරණය පුළුල් කිරීම
- සන්නිවේදන ක්‍රම අවභාවිතය පිළිබඳව නව නීති සම්පාදනය
- ඩිජිටල් තාක්ෂණය භාවිත කිරීම



අන්තර්ගතය :- සී. සී. මලවිපතිරණ මිය, ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, හෝමාගම.
සැකසුම :- කසුන් දොරණෑගොඩ මයා, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය.
අන්තර්ගතය පරීක්ෂා කිරීම:- ජනක් විජේගුණවර්ධන , රාජකීය විද්‍යාලය , හොරණ

Copyright © www.e-thaksalawa.moe.gov.lk

Copyright www.e-thaksalawa.moe.gov.lk

## වාචික සන්නිවේදන මාධ්‍ය

### වාසි

- ගැටලුවක් වඩාත් විස්තරාත්මක ව ඉදිරිපත් කොට , සාකච්ඡා කොට ඉදිරිපත් කළ හැකි වීම
- තොරතුරු දෙන්නා හා ලබන්නා සම්මුඛ වීම
- තොරතුරු ඉතා ඉක්මණින් හා රහසිගතව ඉදිරිපත් කල හැකි වීම

### අවාසි

- භාෂාමය ගැටලු ඇති වීම
- වාචිකමය දුර්වලතා ඇති පාර්ශ්ව සමග තොරතුරු හුවමාරු කර ගැනීමේ ගැටලු ඇති වීම
- තොරතුරු සන්නිවේදනය කළ බවට සාක්ෂියක් නොමැතිවීම

## ලිඛිත සන්නිවේදන මාධ්‍ය

### වාසි

- වඩාත් විස්තරාත්මක ව තොරතුරු ඉදිරිපත් කළ හැකි වීම
- තොරතුරු සන්නිවේදනය කළ බවටත් , ලැබුණු බවටත් සාක්ෂියක් ලෙස භාවිත කළ හැකි වීම
- දත්ත , සටහන් , වගු යනාදිය පහසුවෙන් සන්නිවේදනය කළ හැකි වීම

### අවාසි

- තොරතුරු අවබෝධ කර ගැනීමේදී ගැටලු ඇති වීම
- කියවීමේ හැකියාව නොමැති නම් තොරතුරු සන්නිවේදනය කිරීම අපහසු වීම
- තොරතුරු සන්නිවේදනය කිරීමේදී විකෘති වීම

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය :- සී. සී. මලවිපතිරණ මිය, ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, හෝමාගම.
සැකසුම :- කසුන් දොරණෑගොඩ මයා, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය.
අන්තර්ගතය පරීක්ෂා කිරීම:- ජනක් විජේගුණවර්ධන , රාජකීය විද්‍යාලය , හොරණ

Copyright Ⓒ www.e-thaksalawa.moe.gov.lk

# සංඥා හා සංකේත මාධ්‍යය

## වාසි


- තොරතුරු කෙටියෙන් පැහැදිලි ව ඉදිරිපත් කළ හැකි වීම
- තොරතුරුවල නිරවද්‍යතාව ඉහළ මට්ටමක පැවතීම
- තොරතුරු පහසුවෙන් අවබෝධ කර ගත හැකි වීම






## අවාසි

- දෘෂ්ටි ගැටලු හා ඌණතා ඇති පාර්ශ්ව සමග තොරතුරු හුවමාරු කර ගැනීමේ ගැටලු ඇති වීම
- සංඥා හා සංකේත විකෘති වී යාමෙන් තොරතුරු සන්නිවේදනට බාධා ඇති වීම
- සමහර සංඥා හා සංකේත අවබෝධ කර ගැනීමට අපහසු වීම
- සංඥා හා සාංකේත අවබෝධ කර ගැනීමට ඒවා පිළිබඳ පෙර දැනුම අවශ්‍ය වීම






Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය :- සී. සී. මලවිපතිරණ මිය, ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, හෝමාගම.
සැකසුම :- කසුන් දොරණෑගොඩ මයා, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය.
අන්තර්ගතය පරීක්ෂා කිරීම:- ජනක් විජේගුණවර්ධන , රාජකීය විද්‍යාලය , හොරණ

Copyright © www.e-thaksalawa.moe.gov.lk